# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 1959/7 - 2016 මාර්තු මස 21 වැනි සඳුදා - 2016.03.21**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### බස්නාහිර පළාතේ පළාත් සභාව

**බස්නාහිර පළාතේ පළාත් සභාවේ 1991 අංක 04 දරන පළාත් පාලන ආයතනවල පරිපාලනය අධීක්ෂණය කිරීමේ බලය පිළිබඳ ප්‍රඥප්තියේ 2 වන වගන්තිය යටතේ පැවැත්වෙන පරීක්ෂණය**

බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලි බල හා බල ශක්ති, පරිසර කටයුතු, ජල සම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍ය ඉසුරු දේවප්‍රිය වන මම, බස්නාහිර පළාතේ පළාත් සභාවේ 1991 අංක 4 දරන පළාත් පාලන ආයතන වල පරිපාලනය අධීක්ෂණය කිරීමේ බලය පිළිබඳ ප්‍රඥප්තියේ 2(2) වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පහත සඳහන් කරුණු/චෝදනා හේතු කොට ගෙන ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මොරටුව මහ නගර සභාවේ නගරාධිපති වශයෙන් කටයුතු කිරීමේ දී ඉහත කී ප්‍රඥප්තියේ 2(1) වගන්තිය යටතේ දක්වනු ලබන වරදවල් සිදු කර තිබේද යන්න පරීක්ෂා කර මාස 03 ක් ඇතුළත වාර්තාවක් ඉදිරිපත් කිරීම පිණිස ඒක පුද්ගල පරීක්ෂණ සභාවක් වශයෙන් විශ්‍රාමලත් මහාධිකරණ විනිසුරු කුමාර හේවගේ සුමිත්‍රපාල මැතිතුමා පත් කරමි.

පරීක්ෂා කළ යුතු කරුණු/චෝදනා නම්,

1. ඔබ මොරටුව මහ නගර සභාවේ නගරාධිපති වශයෙන් කටයුතු කරමින් 2015.11.14 දින සිට 2015.12.07 දින දක්වා කාල සීමාව තුළ හෝ ඊට ආසන්න කාලසීමාවක දී මොරටුව මහ නගර සභාවෙහි පාලනය යටතේ වන රාවතාවත්ත සුසානභූමියේ පිහිටා ඇති තේක්ක ගස් කපා ඉවත් කිරීමට මොරටුව මහ නගර සභාවේ විධිමත් සභා සම්මුතියකින් තොරව අනුමැතිය දීමෙන් බස්නාහිර පළාතේ 1991 අංක 04 දරන පළාත් පාලන ආයතනවල පරිපාලනය අධීක්ෂණය කිරීමේ බලය පිළිබඳ ප්‍රඥප්තියේ 2(1) (අ) හා/හෝ 2(1) (ඇ) වගන්තිය / වගන්තිවල සඳහන් වැරදි ක්‍රියා සිදු කළෙහි ය.

2. ඔබ මොරටුව මහ නගර සභාවේ නගරාධිපති වශයෙන් කටයුතු කරමින් මොරටුව මහ නගර සභා පරිශ්‍රයෙහි ආරක්ෂක සේවාව පවත්වාගෙන යාම සම්බන්ධව විධිමත් සභා සම්මුතියකින් තොරව හා/හෝ ගිවිසුම සහා අනුමත කිරීමකින් තොරව රත්නපුර, පල්ලිය පාර, 26/1/1 ඩබ්. ඊ. ආරක්ෂක සේවා පුද්ගලික සමාගම සමග ගිවිසුමකට ඇතුළත් වීමට ක්‍රියා කිරීමෙන් බස්නාහිර පළාතේ 1991 අංක 4 දරන පළාත් පාලන ආයතනවල පරිපාලනය අධීක්ෂණය කිරීමේ බලය පිළිබඳ ප්‍රඥප්තියේ 2(1) (අ) හා/හෝ 2(1) (ඇ) වගන්තිය/වගන්තිවල සඳහන් වැරදි ක්‍රියා සුදු කළෙහි ය.


1A - PG 2895 — 12 (2016/03)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

3. ඔබ මොරටුව මහ නගර සභාවේ නගරාධිපති වශයෙන් කටයුතු කරමින් 2009.07.10 දින සිට 2010.07.30 දින අතර කාල සීමාව තුළ හෝ ඊට ආසන්න කාලසීමාවක දී මොරටුව, දුම්රියපළ පාරේ අංක 163/ඒ දරන ස්ථානයේ සිදුකර ඇති අනවසර ඉදිකිරීම ඉවත් කිරීම සඳහා දෙන ලද අධිකරණ නියෝගය ක්‍රියාත්මක නොකිරීමෙන් හා/හෝ ක්‍රියාත්මක කිරීමට නොහැකි වන ආකාරයට කටයුතු සැළැස්සීමෙන් බස්නාහිර පළාතේ 1991 අංක 4 දරන පළාත් පාලන ආයතනවල පරිපාලනය අධීක්ෂණය කිරීමේ බලය පිළිබඳ ප්‍රඥප්තියේ 2(1) (අ) හා/හෝ 2(1) (ඈ) වගන්තිය/වගන්තිවල සඳහන් වැරදි ක්‍රියා සිදු කළෙහි ය.

තවද, බස්නාහිර පළාතේ පළාත් සභාවේ 1991 අංක 04 දරන පළාත් පාලන ආයතනවල පරිපාලනය අධීක්ෂණය කිරීමේ බලය පිළිබඳ ප්‍රඥප්තියේ 2(2) වගන්තියේ වැඩිදුරටත් සඳහන් විධිවිධාන අනුව, පරීක්ෂණ කොමිෂන් සභා පනත යටතේ පත්කරන ලද කොමසාරිස්වරයකු සතු බලතල මෙම ඒක පුද්ගල පරීක්ෂණ සභාව වෙත හිමිවන අතර, ඉහත සඳහන් කරුණු පරීක්ෂා කිරීමේ දී අදාළ කරගත යුතු බවට හඳුනාගත් ලිඛිත හා වාචික සාක්ෂි පහත උපලේඛනයට ඇතුළත් කර ඇති බවද වැඩිදුරටත් දන්වනු කැමැත්තෙමි.

ඉසුර දේවප්‍රිය,<br>
බස්නාහිර පළාතේ, ප්‍රධාන අමාත්‍ය හා මුදල් හා ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍ය.

2016 මාර්තු මස 16 වැනි දින,<br>
කොළඹ 07, ශ්‍රාවස්ථි මන්දිරයේ පිහිටි,<br>
බස්නාහිර පළාතේ, ප්‍රධාන අමාත්‍යංශයේ දී.

## උපලේඛනය

1. මොරටුව මහ නගර සභාවේ නාගරික කොමසාරිස්, රත්නපුර පල්ලිය පාර, අංක 26/1/1, ඩබ්. ඊ. ආරක්ෂක සේවා පුද්ගලික සමාගමෙහි ප්‍රධාන කළමනාකරු අමතන ලද අංක මො/ආ7/17/2015-1 හා 2015.12.21 දිනැති ලිපියේ කාර්යාලීය පිටපත.

2. මොරටුව මහ නගර සභාවේ ආරක්ෂක සේවා පවත්වාගෙන යාම සම්බන්ධව ඩබ්. ඊ. ආරක්ෂක සේවා පුද්ගලික සමාගම සමග මොරටුව මහ නගර සභාව ගිවිස ගෙන ඇති 2015.12.21 දිනැති ගිවිසුම.

3. 2015, 2016 වර්ෂ සඳහා ආරක්ෂක සේවා සැපයීමට අදාළ ටෙන්ඩරය සම්බන්ධයෙන් 2015.12.17 දිනැති ඇගයීම් පත්‍ර වාර්තාව.

4. මොරටුව මහ නගර සභාවේ නාගරික කොමසාරිස් නගරාධිපතිතුමන් අමතමින් ඉදිරිපත් කර ඇති 2015, 2016 මොරටුව මහ නගර සභාවේ පුද්ගලික ආරක්ෂක සේවාවේ ටෙන්ඩරය සම්බන්ධව මැයෙන් යුතු 2015.12.15 දිනැති වාර්තාව.

5. පළාත් පාලන කොමසාරිස් (බ.ප) මොරටුව මහ නගර සභාවේ නාගරික කොමසාරිස් අමතන ලද අංක LGD/6/5/M 03/2015/ii වෙළුම හා 2015.11.24 දිනැති ලිපි ගොනුවේ පිටපත්.

6. මොරටුව මහ නගර සභාවේ නියෝජ්‍ය නාගරික කොමසාරිස්තුමිය විසින් 2015.08.03 දිනැතිව ආයතන කමිටුව වෙත ඉදිරිපත් කරන ලද ''පහත කරුණු පිළිබඳ සලකා බැලීම'' මැයෙන් ආරම්භ වන මො/ආ7/17/2015-16 දරන ගොණුවේ 74 වශයෙන් ඇතුළත් වාර්තාව.

7. මොරටුව මහ නගර සභාවේ මො/ආ7/17/2015-16 දරන ආරක්ෂක සේවා සැපයීම / 2015-2016 වශයෙන් වූ ගොණුව.

8. මොරටුව මහ නගර සභාවේ ආරක්ෂක සේවා සඳහා මිල ගණන් කැඳවීමට අදාළ 2015.09.08 දිනැති දිණමිණ පුවත්පතෙහි වූ දැන්වීම.

9. මොරටුව මහ නගර සභාවේ ඵලදායීතා කමිටු වාර්තාව 2013.10.11 හා ඊට පදනම් වී ඇති රාවතාවත්ත සුසානභූමියේ හොඳ තත්ත්වයේ හා දිරාපත්වී ඇති තේක්ක ගස් පිළිබඳ තාක්ෂණ නිලධාරී සටහන් සහිත වාර්තාව.

10. මොරටුව මහ නගර සභාවේ නගරාධිපති, මොරටුව මහ නගර සභා නාගරික ඉංජිනේරු වෙත 2015.12.07 දිනෙන් යොමු කර ඇති උපදෙස් ඇතුළත් ලේඛණය.

11. අංක නාඉදෙ/ව්‍යාලි04/DL/47/2015 දරන ගොණුවේ 4 වශයෙන් සටහන් සහිත වාර්තාව.

12. මොරටුව මහ නගර සභාවේ රාවතාවත්ත ආදාහනාගාරයේ තේක්ක ගස් කැපීම මැයෙන් යුත් නාඉදෙ/ව්‍යාලි04/DL/47/2015 දරන ගොණුව.

13. මොරටුව ප්‍රාදේශීය ලේකම් මොරටුව මහ නගර සභාවේ නාගරික කොමසාරිස් අමතන ලද 2015.12.17 දිනැති ලිපිය.

14. මොරටුව මහ නගර සභාවේ අංක සැල/04/අන/ඉදි/30 පී/2008 දරන ගොණුව.

15. මොරටුව මහ නගර සභාවේ නාගරික කොමසාරිස් විසින් නාගරික මන්ත්‍රී ධම්මික චන්ද්‍රනාත් මහතා අමතන ලද අංක සැල/04/අන/ඉදි/30 පී/2008 හා 2009.11.19 දිනැති ලිපිය.

16. මහේස්ත්‍රාත් අධිකරණ අංක 90471 දරන නඩුවේ ගොනුව.

17. නාගරික සංවර්ධන අධිකාරිය විසින් මොරටුව මහ නගර සභා බල ප්‍රදේශය සඳහා, නාගරික සංවර්ධන අධිකාරී බලතල පැවරීමට අදාළ ලේඛනය.

පුද්ගල සාක්ෂි :

| | | |
|---|---|---|
| 1. | එස්. බී. තෙවරප්පෙරුම මහතා | - බැඩබලන නාගරික කොමසාරිස් මොරටුව මහ නගර සභාව |
| 2. | ඩී. එම්. කරුණාරත්න මහතා | - හිටපු නාගරික කොමසාරිස් මොරටුව මහ නගර සභාව |
| 3. | නාගරික ඉංජිනේරු | - මොරටුව මහ නගර සභාව |
| 4. | එස්. කේ. ජයසුන්දර | - නියෝජ්‍ය නාගරික කොමසාරිස් මොරටුව මහ නගර සභාව |
| 5. | නාගරික ලේකම් | - මොරටුව මහ නගර සභාව |
| 6. | තාක්ෂණ නිලධාරී | - මොරටුව මහ නගර සභාව |
| 7. | ප්‍රාදේශීය ලේකම් | - ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, මොරටුව |
| 8. | වී. පී. වර්ණකුලසූරිය මහතා | - හිටපු නාගරික කොමසාරිස් (මොරටුව ම.න.ස.) |
| 9. | යූ. ඩී. සී. ප්‍රනාන්දු මහතා | - හිටපු නාගරික කොමසාරිස් (මොරටුව ම.න.ස.) |
| 10. | අධ්‍යක්ෂ ජනරාල් හෝ ඔහුගේ නියෝජිත | - නාගරික සංවර්ධන අධිකාරිය |
| 11. | ධම්මිකා පී. හෙට්ටිආරච්චි මිය | - විමර්ශන නිලධාරී |
| 12. | ඩබ්ලිව්. පද්මසිරි මහතා | - විමර්ශන නිලධාරී |
| 13. | කේ. ඩබ්ලිව්. එම්. මංජුල මහතා | - විමර්ශන නිලධාරී |

04 - 430

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.